මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **2025/06**

**2025.08.21**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම-2025.05.06**
**පළාත් පාලන ආයතනවලට සභිකයන් තෝරා එවීම**

2025.05.06 දින පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී සභික ධූර හිමිව ඇති පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් එක් එක් පළාත් පාලන ආයතන වෙනුවෙන් නම් කර එවිය යුතු සභික නාමලේඛනය මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවද, පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් දිස්ත්‍රික්ක කිහිපයක නම් කළ යුතු සභික නාම ලේඛනය මෙතෙක් සම්පූර්ණ කර එවා නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, මේ දක්වා සභික ධූර හිමිව ඇති කිසියම් පිළිගත් දේශපාලන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක් විසින් පළාත් පාලන ආයතන සඳහා නම් කර එවිය යුතු සභිකයන්ගේ නම් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවා නොමැති නම් එම දේශපාලන පක්ෂ ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අඥාපනතේ විධිවිධානවලට අනුකූලව අදාළ නාමයෝජනා කඩිනමින් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලබා දෙන මෙන් දන්වා සිටිමි.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අඥාපනත ප්‍රකාරව ඡන්ද විමසීමෙන් අනතුරුව සභික ධූර හිමිව තිබේ නම් කඩිනමින් සභිකයින් නම් කර එවීම තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂවල / ස්වාධීන කණ්ඩායම්වල වගකීම බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ .

ආර්.එම්.ඒ.එල් රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව